අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2001 අගෝස්තු
General Certificate of Education (Adv. Level) Examination, August 2001

කෘෂි විද්‍යාව I - පැ දෙකයි
Agricultural Science I – Two hours

ගණක යන්ත්‍ර භාවිතයට ඉඩ දෙනු නො ලැබේ.

සැලකිය යුතුයි :

(i) සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
(ii) උත්තර පත්‍රයේ දක්වා ඇති ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
(iii) උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද පරෙස්සමෙන් කියවන්න.
(iv) 1 සිට 60 දක්වා වූ එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5), පිළිතුරු වලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගෙන එය උත්තර පත්‍රයේ දැක්වෙන උපදෙස් පරිදි ලකුණු කරන්න.

01. සුප්ත බීජවල ජීව්‍යතාවය නිර්ණය කළ හැක්කේ
(1) පෙට්‍රිදිසි ක්‍රමයෙනි. (2) රැග්ඩෝල් ක්‍රමයෙනි. (3) තවාන් පෙට්ටි ක්‍රමයෙනි.
(4) ටෙට්‍රාසෝලියම් ක්ලෝරයිඩ් ක්‍රමයෙනි. (5) ඉහත කිසිවකින් නො වේ.

02. පසට කොම්පෝස්ට් එකතු කිරීමෙන්
(1) රසායනික පොහොර භාවිත කාර්යක්ෂමතාවය වැඩි වේ.
(2) රසායනික පොහොර භාවිත කාර්යක්ෂමතාවය අඩු වේ.
(3) රසායනික පොහොර භාවිත කාර්යක්ෂමතාවය අඩු වේ.
(4) රසායනික පොහොර භාවිත කාර්යක්ෂමතාවයට බලපෑමක් සිදු නො වේ.
(5) රසායනික පොහොර සමඟ මිශ්‍ර වී ශාකයට හානිකර බලපෑම් ඇති වේ.
(5) පාංශු ක්ෂුද්‍රජීවී ගහණය අඩු වේ.

03. පරපරාගණයට දක්වන අනුවර්තනයක් වනුයේ
(1) ද්විලිංගික පුෂ්ප පිහිටීම ය. (2) සංයුක්ත ඒකාක්ෂයක් පිහිටීම ය. (3) ද්විගෘහතාව (Dioecism) ය.
(4) විසංයෝගතාව (Apomixis) ය. (5) කුඩා කලංකයක් පිහිටීම ය.

04. බීජ සුප්තතාවය ඉවත් කළ හැක්කේ
(1) බීජ ජීවානුහරණය මගිනි. (2) බීජ ආවරණය කිරීමෙනි. (3) බීජ සීරීමෙනි.
(4) බීජ ආමුඛලනය කිරීමෙනි. (5) ඉහත කිසිවකින් නො වේ.

05. ද්විතීයික බිම් සැකසීමේ උපකරණයකට උදාහරණයක් වනුයේ
(1) මෝල්ඩ් බෝර්ඩ් නගුල ය. (2) දේශීය නගුල ය. (3) ජපන් රොටරි වීඩරය ය.
(4) තැටි පෝරුව ය. (5) යටි පස බුරුල් කරන නගුල (Subsoil chisel) ය.

06. පහත ප්‍රකාශ අතරෙන් වඩාත් නිවැරදි වනුයේ
(1) "වැඩි දෘශ්‍ය ඝනත්වයක් සහිත පස හොඳ වාතනයක් දක්වයි" වේ.
(2) "අඩු දෘශ්‍ය ඝනත්වයක් සහිත පස හොඳ වාතනයක් දක්වයි" වේ.
(3) "බිම් සැකසීමෙන් පසෙහි දෘශ්‍ය ඝනත්වය වැඩි වේ" වේ.
(4) "තද වර්ණයෙන් යුත් පස්වල දෘශ්‍ය ඝනත්වය වැඩි ය" වේ.
(5) "කණිකාමය ව්‍යුහයක් සහිත පසෙහි දෘශ්‍ය ඝනත්වය වැඩි ය" වේ.

07. සුප්ත බීජ
(1) ජීව්‍ය වන අතර ප්‍රරෝහණයට අවශ්‍ය බාහිර තත්ත්ව ලබා දුන් විට ප්‍රරෝහණය වේ.
(2) ජීව්‍ය වන නමුත් ප්‍රරෝහණයට අවශ්‍ය වන බාහිර තත්ත්ව ලබා දුන් විට ප්‍රරෝහණය වේ.
(3) ජීව්‍ය වන අතර බීජ ජීවානුහරණය කිරීමෙන් පසුව පමණක් ප්‍රරෝහණය වේ.
(3) ජීව්‍ය වන අතර ප්‍රරෝහණයට අවශ්‍ය බාහිර තත්ත්ව ලබා දුන් විට ප්‍රරෝහණය නොවේ.
(4) අජීව්‍ය වන අතර බීජ සීරීමෙන් පසුව ද ප්‍රරෝහණය නො වේ.
(5) අජීව්‍ය වන අතර අම්ල ප්‍රතිකාරයෙන් පසුව ද ප්‍රරෝහණය නො වේ.

08. MS (Murashige and Skoog) මාධ්‍යය යනු
(1) ශාක හෝර්මෝනයකි. (2) පටක රෝපණ මාධ්‍යයකි. (3) ශාක වර්ධක යාමකයකි.
(4) දියර පොහොරකි. (5) දිලීරනාශකයකි.

09. පහත රට වියළි කලාපයේ තෙත් පසක් දක්වන කෘෂි පාරිසරික කලාපය සංකේතවත් කරනුයේ
(1) IL_1 මගිනි. (2) IL_3 මගිනි. (3) DL_1 මගිනි. (4) DL_5 මගිනි. (5) IM_1 මගිනි.

10. අන්තර් නිවර්තන අභිසාරී කලාපය (Inter – tropical convergence zone) දිවයිනෙන් උතුරු දෙසට විස්ථාපනය වනුයේ
(1) අන්තර් මෝසම I කාලයේ දී ය. (2) නිරිත දිග මෝසම් කාලයේ දී ය.
(3) අන්තර් මෝසම II කාලයේ දී ය. (4) ඊසාන දිග මෝසම් කාලයේ දී ය.
(5) සියළු ම වර්ෂා කාලයන් හි දී ය.

මාස්ටර් ගයිඩ් ප්‍රකා...
Scanned with CamScanner

11. විපරිත (Metamorphic) පාෂාණ සැදෙනුයේ
(1) මැග්මා (Magma) ක්ෂණිකව සිසිල් වීමෙනි.
(2) ආග්නේය හා අවසාදිත පාෂාණ අධික පීඩනයට හා උෂ්ණත්වයට භාජනය වීමෙනි.
(3) තැන්පත් වූ මැටි අධික පීඩනයට හා උෂ්ණත්වයට භාජනය වීමෙනි.
(4) ප්‍රාථමික පාෂාණ ජීරණය වීමෙනි.
(5) ඉහත ක්‍රියාවලි කිසිවකින් නොවේ.

12. ශූන්‍ය බිම් සැකසීමේ දී
(1) අවම බිම් සැකසීමෙන් සුදුසු පාත්තියක් සකසනු ලැබේ.
(2) ප්‍රාථමික බිම් සැකසීම පමණක් කරනු ලැබේ.
(3) බීජය සිටුවීම සඳහා කුඩා සිදුරක් සාදනු විනා පාත්තියක් සැකසීමක් කරනු නො ලැබේ.
(4) ප්‍රාථමික හා ද්විතියික බිම් සැකසීම කරනු ලබන නමුත් පාත්තියක් සැකසීමක් නැත.
(5) කිසිම බිම් සැකසීමකින් තොරව පාත්තිය පමණක් සකසනු ලැබේ.

13. එක්තරා පෘෂ්ඨීය වාරි ජලසම්පාදන ක්‍රමයක වාසි සමහරක් පහත දක් වේ.
(A) ජලය සපයන භූමි ප්‍රමාණය මුළු භූමි ප්‍රමාණයෙන් ½ පමණ වේ.
(B) අතුරුයත් ගෑම පහසු ය.
(C) වාෂ්පීකරණ හානි අඩු ය.

මෙම ක්‍රමය වනුයේ
(1) ජලයෙන් යට කිරීම (Flood irrigation) ය.
(2) බේසම් ජලසම්පාදනය ය.
(3) තීරු ජලසම්පාදනය ය.
(4) බිංදුමය ජලසම්පාදනය ය.
(5) ඇලි හා වැටි ජලසම්පාදනය ය.

- වියළි හා තෙත් බල්බ උෂ්ණත්ව වෙනසට අනුකූල සාපේක්ෂ ආර්ද්‍රතාව පහත වගුවෙහි දක්වා ඇත. අංක 14 හා 15 ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම සඳහා මෙම වගුව භාවිත කරන්න.

උෂ්ණත්වය (C^0)	වියළි හා තෙත් බල්බ වෙනස					
	0.5	1.0	1.5	2.0	2.5	3.0
28	96	93	89	85	82	78
30	96	93	89	86	83	79
32	96	93	90	86	83	80

14. එක්තරා ස්ථානයක වියළි හා තෙත් බල්බ පාඨාංක පිළිවෙළින් 30^0C හා 28^0C විය. මෙම ස්ථානයේ සාපේක්ෂ ආර්ද්‍රතාව වනුයේ
(1) 85% ක් වේ. (2) 86% ක් වේ. (3) 93% ක් වේ. (4) 83% ක් වේ. (5) 78% ක් වේ

15. වාතයේ අවම තෙතමන ප්‍රමාණයක් වාර්තා වනුයේ වියළි හා තෙත් බල්බ පාඨාංක පිළිවෙළින්
(1) 28°C හා 31°C වූ විටදී ය.
(2) 31°C හා 28°C වූ විටදී ය.
(3) 25°C හා 28°C වූ විටදී ය.
(4) 28°C හා 25°C වූ විටදී ය.
(5) 28.5°C හා 28°C වූ විටදී ය.

16. $2Fe_2O_3 + 3H_2O \longrightarrow 2Fe_2O_3 . 3H_2O$
හීමටයිට් ලිමොනයිට්

ඉහත සමීකරණය උදාහරණයක් වනුයේ
(1) ද්‍රාවණය සඳහා ය.
(2) සජලනය සඳහා ය.
(3) ඔක්සිකරණය සඳහා ය.
(4) ජලවිච්ඡේදනය සඳහා ය.
(5) ඔක්සිහරණය සඳහා ය.

17. ගුරුත්වාකර්ෂණ ජලය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දක්වේ.
(A) හොඳ ජලවහන තත්ත්වයක් යටතේ ගුරුත්වාකර්ෂණ ජලය පාංශු පැතිකඩෙන් වහනය වේ.
(B) ගුරුත්වාකර්ෂණ ජලය "ශාකයට ලබාගත හැකි ජලය" ලෙස සැලකේ.
(C) pF අගය 2.5 ට අඩු පාංශු ජලය ගුරුත්වාකර්ෂණ ජලය ලෙස සැලකේ.

ඉහත ප්‍රකාශ අතරෙන් වඩාත් නිවැරදි වනුයේ
(1) A පමණි. (2) B පමණි. (3) C පමණි. (4) A හා B පමණි. (5) A හා C පමණි.

18. පාංශු පැතිකඩකින් ජලය ඉවත් වනුයේ
(1) ගැඹුරට වැස්සීම (Percolation), කාන්දු වීම (Infiltration) හා වාෂ්පීකරණය (Evaporation) මගිනි.
(2) ගැඹුරට වැස්සීම, වාෂ්පීකරණය, උත්ස්වේදනය හා ජලවහනය මගිනි.
(3) වාෂ්පීකරණය, උත්ස්වේදනය, අපධාවය හා ජලවහනය මගිනි.
(4) අපධාවය, කාන්දු වීම, ජලවහනය හා ගැඹුරට වැස්සීම මගිනි.
(5) කාන්දු වීම හා උත්ස්වේදනය මගින් පමණි.

Scanned with CamScanner

19. පසක වයනය වැදගත් වනුයේ,
   (A) පසට ජලය කාන්දුවන වේගය නිර්ණය කිරීමට ය.
   (B) පසෙහි ජලය රඳා සිටීමේ ධාරිතාව නිර්ණය කිරීමට ය.
   (C) පසේ වර්ණය නිර්ණය කිරීමට ය.
   (D) පසෙහි ඇති කාබනික ද්‍රව්‍ය ප්‍රමාණය නිර්ණය කිරීමට ය.

ඉහත ප්‍රකාශ අතරෙන් වඩාත් නිවැරදි වනුයේ,
(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) A හා D පමණි. (4) B හා C පමණි. (5) B හා D පමණි.

20. පහත සඳහන් ප්‍රකාශ අතරෙන් වඩාත් නිවැරදි වනුයේ,
   (1) "හොඳින් සැකසූ පසක කේශික සිදුරුවලට කේශික නොවන සිදුරු දක්වන අනුපාතය එකකට වැඩි විය යුතු ය" වේ.
   (2) "හොඳින් සැකසූ පසක කේශික සිදුරුවලට කේශික නොවන සිදුරු දක්වන අනුපාතය එකකට අඩු විය යුතු ය" වේ.
   (3) "හොඳින් සැකසූ පසක කේශික සිදුරු හා කේශික නොවන සිදුරු ආසන්න වශයෙන් සමාන ව පිහිටා තිබිය යුතු ය" වේ.
   (4) "පසක කේශික සිදුරුවලට කේශික නොවන සිදුරු දක්වන අනුපාතය බිම් සැකසීම සමග වෙනස් නො වේ" වේ.
   (5) "කේශික සිදුරුවලට කේශික නොවන සිදුරු දක්වන අනුපාතය පසක අංශු (සත්‍ය) ඝනත්වය සමග වෙනස් වේ" වේ.

21. මෝසම් කාලයේ දී වැසි දියෙන් කරනු ලබන වගාවන්හි අස්වැන්න, වියළි කාලයේ දී වාරි ජලයෙන් කරනු ලබන වගාවන් හි අස්වැන්නට වඩා අඩු ය. මෙයට ප්‍රධාන හේතුව වනුයේ මෝසම් කාලයේ
   (1) පස ඛාදනය වීම නිසා සාරවත් බවින් අඩු වීම ය.
   (2) පවතින් අඩු උෂ්ණත්වය නිසා ප්‍රභාසංශ්ලේෂණ වේගය අඩු වී එය අස්වැන්නට බලපෑම ය.
   (3) වලාකුළු වලින් අහස වැසීම නිසා ආලෝක තීව්‍රතාවය අඩු වී එය ප්‍රභාසංශ්ලේෂණයට බලපෑම ය.
   (4) පවතින අධික ආර්ද්‍රතාව නිසා පුටිකා වැසී එය ප්‍රභාසංශ්ලේෂණයට බලපෑම ය.
   (5) පවතින අධික වර්ෂාපතනය නිසා ප්‍රභාසංශ්ලේෂක පටකවලට හානි වී එය අස්වැන්නට බලපෑම ය.

22. පසෙහි යාන්ත්‍රික ප්‍රතිරෝධය (Mechanical resistance) පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දක් වේ.
   (A) අධික ප්‍රතිරෝධයක් සහිත පසක වාතනය දුර්වල ය.
   (B) අධික ප්‍රතිරෝධයක් සහිත පස අල බෝග සඳහා වඩාත් සුදුසු ය.
   (C) අධික ප්‍රතිරෝධයක් සහිත පසෙහි දෘශ්‍ය ඝනත්වය අධික වේ.
   (D) අධික ප්‍රතිරෝධයක් සහිත පසෙහි බිම් සැකසීම පහසු ය.

ඉහත ප්‍රකාශ අතරෙන් වඩාත් නිවැරදි වනුයේ
(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) A හා D පමණි. (4) B හා C පමණි. (5) B හා D පමණි.

23. කෘත්‍රිම බීජ නිපදවීමේ දී විජලනය කළ කලලක (Dehydrated embroids) වට කරනු (Encapsulate) ලබනුයේ
   (1) සෝඩියම් ඇල්ජිනේට් වලිනි. (2) කැල්සියම් නයිට්‍රේට් වලිනි. (3) කැල්සියම් ඇල්ජිනේට් වලිනි.
   (4) සෝඩියම් ක්ලෝරයිඩ් වලිනි. (5) කැල්සියම් ක්ලෝරයිඩ් වලිනි.

*24. අර්ධ ප්‍රමුඛතාව යනු
   (1) ජානයක් තුළ සිදුවන අන්තර් ක්‍රියාවකි. (2) ජාන දෙකක් අතර සිදුවන අන්තර් ක්‍රියාවකි.
   (3) මාරක සාධක ප්‍රවේණිය ලෙස සැලකේ. (4) ජාන අන්තර් ක්‍රියාවක් නොවේ.
   (5) ශාකවල දක්නට නොලැබෙන දෙයකි.

25. කොම්පෝස්ට් ගොඩ සාමාන්‍යයෙන් මතුපිට පස් හෝ පරිණත කොම්පෝස්ට් වලින් වසනු ලැබේ. මෙය කරනු ලබන්නේ
   (1) කොම්පෝස්ට් ගොඩ හිරු එළියෙන් රැක ගැනීමට ය.
   (2) කොම්පෝසට් ගොඩ මීයන් වැනි මහා පලිබෝධයන්ගෙන් රැක ගැනීමට ය.
   (3) ජීරණයේ දී කොම්පෝස්ට් ගොඩෙන් නිකුත් වන වායු හසු කර ගැනීම සඳහා ය.
   (4) කොම්පෝස්ට් ගොඩෙන් නිකුත් වන දුර්ගන්ධය අඩු කිරීම සඳහා ය.
   (5) කොම්පෝස්ට් ගොඩ වර්ෂාවෙන් රැක ගැනීමට ය.

26. වී වගාවට හානිකරන කහ පුරුක් පණුවා (Yellow stem borer) අයත් වන ගෝත්‍රය වනුයේ
   (1) ඩිප්ටෙරා ය. (2) හෙමිප්ටෙරා ය. (3) අයිසොප්ටෙරා ය.
   (4) ඔඩොනාටා ය. (5) ලෙපිඩොප්ටෙරා ය.

27. පහත ප්‍රකාශ අතරෙන් වඩාත් නිවැරදි වනුයේ
   (1) "පොලිතීන් ගෘහ, හරිතාගාරවලට වඩා මිල වැඩි ය" වේ.
   (2) "පොලිතීන් ගෘහ, ජල සංරක්ෂණය සඳහා භාවිත කළ හැකි ය" වේ.
   (3) "පොලිතීන් ගෘහ සුදුසු වන්නේ වර්ධක ප්‍රචාරණ බෝග සඳහා පමණි" වේ.
   (4) "ලණු ගෘහ (Lath houses) සුදුසු පතුමය එළවළු සඳහා පමණි" වේ.
   (5) "හරිතාගාර, වර්තමාන ලංකාවේ භාවිත වන වඩාත් ම ප්‍රචලිත ප්‍රචාරක ව්‍යුහ වේ" වේ

28. හරිතාගාරවල "හරිතාගාර ආචරණය" මගින් පවත්වා ගත හැක්කේ
   (1) ඉහළ ආර්ද්‍රතාවක් වේ. (2) ඉහළ උෂ්ණත්වයක් වේ. (3) වැඩි ආලෝක තීව්‍රතාවක් වේ.
   (4) අඩු ආර්ද්‍රතාවක් වේ. (5) අඩු උෂ්ණත්වයක් වේ.

Scanned with CamScanner

29. ප්‍රතිඋත්ස්වේදන කාරක භාවිතයෙන් අඩු කළ හැක්කේ
(1) ස්වසන වේගය ය. (2) ප්‍රභාසංස්ලේෂණ වේගය ය. (3) උත්ස්වේදන වේගය ය.
(4) වාෂ්පීකරණ වේගය ය. (5) බිංදුදය වීමේ වේගය ය.

30. ශෛලම තුළ ජල පරිවහණය සඳහා වඩාත් ම පිළිගත් න්‍යාය වනුයේ
(1) වායුගෝලීය පීඩන වාදය ය. (2) නිපාන වාදය ය. (3) කේශාකර්ෂණ වාදය ය.
(4) මූල පීඩන වාදය ය. (5) උත්ස්වේදන චූෂණ වාදය ය.

31. වර්ධනය නිශේධනය කරන ශාක හෝර්මෝනයක් වනුයේ
(1) ඔක්සින් ය. (2) ගිබරලින් ය. (3) සයිටොකයිනීන් ය.
(4) ඇබ්සිසික් අම්ලය ය. (5) ඉහත කිසිවක් නොවේ.

32. ඇලොයින් (Aloin) අඩංගු වනුයේ
(1) වෙනිවැල් ගැට (Coscirium fenestratum) වල ය. (2) සින්කෝනා (Cinchona ledgeriana) වල ය.
(3) කෝමාරිකා (Aloe vera) වල ය. (4) කොහොඹ (Azadirachta indica) වල ය.
(5) මිංචි (Mentha arnensis) වල ය.

33. අඩු LD_{50} අගයක් සහිත කෘමිනාශක අසුරනයක් ලේබල් කර ඇත්තේ
(1) තද රතු පාටෙනි. (2) කොළ පාටෙනි. (3) කහ පාටෙනි. (4) නිල් පාටෙනි. (5) රෝස පාටෙනි.

● අංක 34 ප්‍රශ්නය සඳහා පහත රූප සටහන භාවිත කරන්න.



34. A හි සමතුලිත ජල මට්ටම, B හි සමතුලිත ජල මට්ටමට වඩා ඉහළ යාමට ප්‍රධාන වශයෙන් බලපානුයේ
(1) ගුරුත්වාකර්ෂණ බලය වේ. (2) ජලාකර්ෂක බලය වේ. (3) කේශාකර්ෂණ බලය වේ.
(4) සංසක්ත බලය වේ. (5) ආසක්ත බලය වේ.

35. එළදෙනකගේ සංකීර්ණ ආමාශයේ ධාරිතාවය වනුයේ
(1) ලීටර 50 - 100 කි. (2) ලීටර 101 - 150 කි. (3) ලීටර 175 - 225 කි.
(4) ලීටර 250 - 300 කි. (5) ලීටර 300 ට වැඩිය.

36. අත්‍යාවශ්‍ය ඇමයිනෝ අම්ල වනුයේ
(1) හිස්ටිඩීන්, අයිසොලියුසීන්, මෙතියොනීන්, සහ ට්‍රිප්ටොපෑන් ය.
(2) හිස්ටිඩීන්, අයිසොලියුසීන්, මෙතියොනීන් සහ ඇලනීන් ය.
(3) හිස්ටිඩීන්, අයිසොලියුසීන්, සිස්ටීන් සහ ඇලනීන් ය.
(4) හිස්ටිඩීන්, අයිසොලියුසීන්, ග්ලයිසීන් සහ සිස්ටීන් ය.
(5) හිස්ටිඩීන්, ටයිරොසීන්, ග්ලයිසීන් සහ සිස්ටීන් ය.

37. මේදයෙහි ද්‍රාව්‍ය වන විටමින වනුයේ
(1) A, B, C සහ D ය. (2) A, B, D සහ K ය. (3) A, C, D සහ K ය.
(4) A, D, E සහ K ය. (5) A, B, E සහ K ය.

38. ඌරන්ගේ දළ තන්තු ජීරණය වනුයේ
(1) ආමාශයේ දී ය. (2) කුඩා අන්ත්‍රයේ දී සහ මහ අන්ත්‍රයේ දී ය. (3) උණ්ඩුකපුච්ඡයේ දී ය.
(4) ජඨරාග්නියේ දී ය. (5) බහුනැම්යේ දී ය.

39. වාණිජ ලෙස ඇතිකරන කිකිළියකගේ ඩිම්බ මෝචනයේ සිට බිත්තර දැමීම දක්වා ගතවන කාලය
(1) පැය 10 - 12 කි. (2) පැය 15 - 18 කි. (3) පැය 20 - 22 කි.
(4) පැය 24 - 26 කි. (5) පැය 27 - 29 කි.

Scanned with CamScanner

40. බිත්තරයක මේදය බහුල ලෙස අඩංගු වනුයේ
(1) සුදු මදයේ සහ කහමදයේ ය. (2) තුනී සහ ඝන සුදු මදයේ ය. (3) ඝන සුදුමදයේ සහ කහමදයේ ය.
(4) කහමදයේ සහ කටුවේ පටලවල ය. (5) කහමදයේ ය.

41. රූමනයේ pH පරාසය වනුයේ
(1) 2.5 සිට 3.5 වේ. (2) 4.0 සිට 5.0 වේ. (3) 5.5 සිට 6.5 වේ.
(4) 7.0 සිට 8.0 වේ. (5) ඉහත සඳහන් කිසිවක් නො වේ.

42. පෙප්සින් සහ ඇමයිලේස් ස්‍රාවය වනුයේ
(1) රූමනයේ දී ය. (2) ජඨරාග්නියේ දී ය. (3) ග්‍රහණියේ දී ය.
(4) කුඩා අන්ත්‍රයේ දී ය. (5) මහා අන්ත්‍රයේ දී ය.

43. පහත දැක්වෙන්නේ ක්ෂුද්‍ර ජීවීන් සමහරෙකි.
(A) බැසිලස් සිරියස් (Bacillus cereus) (B) ක්ලොස්ට්‍රිඩියම් පර්ෆින්ජන්ස් (Clostridium perfringens)
(C) ලැක්ටොබැසිලස් (Lactobacillus) (D) සැල්මොනෙල්ලා (Salmonella)
මේ අතරෙන් ආහාර විෂ කරන ක්ෂුද්‍ර ජීවීන් වනුයේ
(1) A සහ B පමණි. (2) B සහ C පමණි. (3) B සහ D පමණි.
(4) A, B සහ D පමණි. (5) B,C සහ D පමණි.

44. කිරිවලට සාපේක්ෂ ව මුල්කිරිවල
(1) වැඩිපුර ඝන ද්‍රව්‍ය, අඩු ප්‍රෝටීන් සහ අඩු පොස්පොලිපිඩ ප්‍රමාණයක් අඩංගු වේ.
(2) වැඩිපුර ඝනද්‍රව්‍ය, වැඩිපුර ප්‍රෝටීන්, සහ වැඩිපුර පොස්පොලිපිඩ ප්‍රමාණයක් අඩංගු වේ.
(3) අඩු ඝනද්‍රව්‍ය, වැඩිපුර ප්‍රෝටීන් සහ අඩු පොස්පොලිපිඩ ප්‍රමාණයක් අඩංගු වේ.
(4) අඩු ඝනද්‍රව්‍ය, අඩු ප්‍රෝටීන් සහ අඩු පොස්පොලිපිඩ ප්‍රමාණයක් අඩංගු වේ.
(5) අඩු ඝනද්‍රව්‍ය, අඩු ප්‍රෝටීන් සහ වැඩිපුර පොස්පොලිපිඩ ප්‍රමාණයක් අඩංගු වේ.

45. මොල්ලිය සහ තැල්ල මගින් ශරීරයේ පෘෂ්ඨීය ක්ෂේත්‍රඵලය වැඩිකර ගැනීම දක්නට ලැබෙනුයේ.
(1) ඉන්දීය ගව වර්ගවල ය. (2) යුරෝපීය ගව වර්ගවල ය. (3) ෆ්‍රීසියන් ගවයින්ගේ ය.
(4) ජර්සි ගවයින්ගේ ය. (5) සාහත් එළුවන්ගේ ය.

46. ප්‍රෝටීනවල අවශ්‍යයෙන්ම අඩංගු වන මූලද්‍රව්‍ය වනුයේ.
(1) C, H, O, N සහ P (2) C, H, O, S සහ N (3) C, H, S සහ O
(4) C, H, N සහ O (5) C, H, N, O, P සහ S

47. ප්‍රෝටීන, කාබොහයිඩ්‍රේට හා මේදවල අඩංගු මුලු ශක්ති ප්‍රමාණය පිළිවෙළින්
(1) 4, 6 සහ 9 කැලරි / ග්‍රෑම් වේ. (2) 5, 9 සහ 4 කැලරි / ග්‍රෑම් වේ. (3) 9, 4 සහ 6 කැලරි / ග්‍රෑම් වේ.
(4) 4, 4 සහ 9 කැලරි / ග්‍රෑම් වේ. (5) 4, 4 සහ 5 කැලරි / ග්‍රෑම් වේ.

48. නිදහස ලැබීමෙන් පසු (වර්ෂ 1948 න් පසු) කෘෂිකර්මාන්තයෙන් ශ්‍රී ලංකාවේ දළ ජාතික නිෂ්පාදනයට (GDP) ලැබුන ප්‍රතිශත දායකත්වය.
(1) සැලකිය යුතු ලෙස ඉහළ ගියේ ය. (2) ක්‍රමයෙන් අඩු විය. (3) ස්ථාවර ව පැවතුනි.
(4) ඉහළ තැග ස්ථාවර ව පැවතුනි. (5) ස්ථාවර ව පැවති පසුව ඉහළ ගියේ ය.

49. වර්තමානයේ ශ්‍රී ලංකාවේ වගා කළ හැකි ඒක පුද්ගල ඉඩම් ප්‍රමාණය
(1) හෙක්ටාර 0.5 ට අඩු ය. (2) හෙක්ටාර 0.5 - 1.0 අතර ය. (3) හෙක්ටාර 1.1 - 2.0 අතර ය.
(4) හෙක්ටාර 2.1 - 3.0 අතර ය. (5) හෙක්ටාර 3.0 ට වැඩි ය.

50. අත්‍යවශ්‍ය ක්ෂුද්‍ර මූලද්‍රව්‍ය සඳහා උදාහරණ වනුයේ
(1) සල්ෆර්, මොලිබ්ඩිනම් සහ කොපර් වේ. (2) පොස්පරස්, සින්ක් සහ ක්ලෝරීන් වේ.
(3) මැග්නීසියම්, කැල්සියම් හා මැංගනීස් වේ. (4) මැංගනීස්, අයන් සහ බෝරෝන් වේ.
(5) සල්ෆර්, කොපර් හා සින්ක් වේ.

51. අන්ත බීජ (Terminator seeds) යනු
(1) ආර්ද්‍ර නිවර්තන ප්‍රදේශවල දී ජීව්‍ය නොවන බීජ වේ. (2) ඊළඟ පරම්පරාවේ දී ජීව්‍ය බීජ නිපදවන්නේ නැති බීජ වේ.
(3) සැමවිට ම විෂද්‍රව්‍ය නිපදවන බීජ වේ. (4) කන්නය අගදී සිටුවන බීජ වේ.
(5) ඉහත කිසිවක් නො වේ.

52. පහත දී ඇත්තේ ලංකාවේ දක්නට ඇති වල් පැලෑටි විශේෂ කිහිපයකි.
(A) ඇකලිපා ඉන්ඩිකා (Acalypha indica) (B) මිමොසා පිග්‍රා (Mimosa pigra)
(C) පාතේනියම් හිස්ටෙරොපෝරස් (Partheniam hysterophorus)
(D) වනෝනියා සිනෙරා (Vernonia cinera) (E) සයිනොඩොන් ඩැක්ටිලෝන් (Cynodon dactylon)
ඉහත විශේෂ අතරෙන් ශ්‍රී ලංකාවට ආගන්තුක ආක්‍රමණකාරී වල් පැළෑටි ලෙස මෑතක දී හඳුනාගත් ශාක වනුයේ.
(1) A හා B පමණි. (2) A හා C පමණි. (3) A හා D පමණි.
(4) B හා C පමණි. (5) D හා E පමණි.

මාස්ටර් ගයිඩ් ප්‍රකාශනයකි
Scanned with CamScanner

53. කෘෂි පළිබෝධ කළමනාකරණයේදී ආර්ථික හානිදායක මට්ටම ලෙස සලකනු ලබන්නේ
(1) පළිබෝධ ගහණ සමතුලිතව පවතින මට්ටම ය.
(2) පළිබෝධයන් විශාල සංඛ්‍යාවක් ලෙස හමුවන මට්ටම ය.
(3) පාලන ක්‍රම අනුගමනය කළ යුතු මට්ටම ය.
(4) පාලනය සඳහා යන වියදම අධික මට්ටම ය.
(5) පළිබෝධයන් ශාක මත යැපීමට පටන් ගන්නා මට්ටම ය.

54. ශ්‍රී ලංකාවේ හමුවන වල් පැළෑටි කිහිපයක් පහත දක්වා ඇත.
(A) සයිපරස් රොටුන්ඩස් (Cyperus rotundus)
(B) ඇක්සොනෝපස් කොම්ප්‍රෙසස් (Axonopus compressus)
(C) ලැන්ටානා කැමරා (Lantana camara)
(D) ස්ටැචිටපීටා ඉන්ඩිකා (Stachytarpheta indica)

ඉහත විශේෂ අතරෙන් පලල් පත්‍ර වල් පැළෑටි ලෙස වර්ග කළ හැක්කේ
(1) A හා B පමණි.
(2) A හා C පමණි.
(3) A හා D පමණි.
(4) B හා C පමණි.
(5) C හා D පමණි.

55. පසුගිය ශතවර්ෂය තුළ දී ශ්‍රී ලංකාවේ භූමි ප්‍රමාණයට අනුව වන ආවරණය
(1) 100% සිට 10% පමණ දක්වා අඩු වී ඇත.
(2) 80% සිට 50% පමණ දක්වා අඩු වී ඇත.
(3) 60% සිට 40% පමණ දක්වා අඩු වී ඇත.
(4) 80% සිට 20% පමණ දක්වා අඩු වී ඇත.
(5) 70% සිට 10% පමණ දක්වා අඩු වී ඇත.

56. පළතුරු හා එළවළු ශ්‍රේණි ගත කිරීමෙන්
(1) කෘෂිකාර්මික යෙදවුම්වලට හොඳ මිලක් ලබාගත හැකි ය.
(2) නිෂ්පාදිතයට ඉහළ විකුණුම් මිලක් ලබා ගත හැකි ය.
(3) පළතුරු හා එළවළු මිල ස්ථාවර කළ හැකි වේ.
(4) පළතුරු හා එළවළු ආදේශන සඳහා ඇති වෙළෙඳපළ ඉල්ලුම අඩු කළ හැකි ය.
(5) පළතුරු හා එළවළු අනුපූරක සඳහා ඇති වෙළෙඳපළ ඉල්ලුම වැඩි කළ හැකි වේ.

57. වී බීජවල තෙතමන ප්‍රතිශතය සෙවීමේ පරීක්ෂණයක දී පහත දත්ත ලැබුණි.

බීජ නියැදියේ මූලික බර	=	200g
බීජ නියැදිය නියත බරකට වියළීමෙන් පසු බර	=	180g

වී බීජ නියැදියේ තෙතමන ප්‍රතිශතය වනුයේ
(1) 0.1% වේ. (2) 1.0% වේ. (3) 10.0% වේ. (4) 1.11% වේ. (5) 11.1% වේ.

58. පාංශු තෙතමන ප්‍රමාණය නිර්ණය සඳහා කරන ලද පරීක්ෂණයක දී පහත දත්ත ලැබුණි.

බඳුනේ බර	=	30g
බඳුන + පස්වල බර	=	60g
බඳුන + වියළි පස්වල බර	=	50g

පසේ තෙතමන ප්‍රතිශතය වනුයේ.
(1) 0.5% වේ. (2) 5.0% වේ. (3) 50.5% වේ. (4) 10.0% වේ. (5) 1.0% වේ.

59. ලාභ උපරිම කරන ගොවියෙකු යෙදිය යුතු පොහොර ප්‍රමාණයක් තීරණය කරන්නේ
(1) හීනවන ඵල ක්‍රියාත්මක වන ආකාරයට ය.
(2) ආන්තික නිෂ්පාදනයේ අගය බිංදුවට සමාන වන ආකාරයට ය.
(3) ආන්තික නිෂ්පාදනයේ අගය වැටුපට සමාන වන ආකාරයට ය.
(4) ආන්තික නිෂ්පාදනයේ අගය පොහොර මිලට සමාන වන ආකාරයට ය.
(5) නිෂ්පාදිතයේ මුළු වටිනාකම උපරිම වන ආකාරයට ය.

60. හීනවන ආන්තික උපයෝගිතා න්‍යායට අනුව
(1) භාණ්ඩයේ පරිභෝජනය වැඩි වීම සමග මුළු උපයෝගිතාව හීන වේ.
(2) භාණ්ඩයේ ලබාගත් ප්‍රමාණය වැඩි වීම සමග භාණ්ඩයේ ප්‍රයෝජනවත් බව හීන වේ.
(3) අනෙකුත් සියළුම භාණ්ඩ පරිභෝජනය නියත ව තිබියදී යම් භාණ්ඩයක් පරිභෝජනය කරන ප්‍රමාණය වැඩි වීම සමග එම භාණ්ඩය ඒකකයක වෘද්ධි උපයෝගිතාව අඩු වේ.
(4) ආන්තික උපයෝගිතාව උපරිම වන විටදී යම් භාණ්ඩයක් පරිභෝජනය කිරීමේ මුළු උපයෝගිතාව උපරිම වේ.
(5) භාණ්ඩයේ පරිභෝජන ප්‍රමාණය අඩු වීම සමග ආන්තික උපයෝගිතාව හීන වේ.

*** ** ***

Scanned with CamScanner

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2001 අගෝස්තු
General Certificate of Education (Adv. Level) Examination, August 2001

කෘෂි විද්‍යාව II - පැ තුනයි
Agricultural Science II – Three hours

මෙම ප්‍රශ්න පත්‍රය "අ" හා "ආ" යනුවෙන් කොටස් දෙකකින් සමන්විත ය. මෙම කොටස් දෙකට ම වෙන් කර ඇති කාලය පැ තුනයි.

"අ" කොටස - ව්‍යුහගත රචනා

සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න. ඔබේ පිළිතුරු එක් එක් ප්‍රශ්න යටතේ ඉඩ සලසා ඇති තැන්වල ලියන්න. මෙම ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බව ද දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු නොවන බව ද සලකන්න.

"ආ" කොටස - රචනා

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න. ඒ සඳහා සපයනු ලබන කඩදාසි පාවිච්චි කරන්න. සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු "අ" සහ "ආ" කොටස් එක් උත්තර පත්‍රයක් වන සේ "අ" කොටස උඩින් තිබෙන පරිදි අමුණා, විභාග ශාලාධිපතිට භාර දෙන්න.

ප්‍රශ්න පත්‍රයේ "ආ" කොටස පමණක් විභාග ශාලාවෙන් පිටතට ගෙන යාමට අවසර ඇත.

"අ" කොටස - ව්‍යුහගත රචනා

සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(එක් ප්‍රශ්ණයකට ලකුණු 10 බැගින් ලැබේ.)

---

01. (A) (i) බිම් සැකසීමේ පරමාර්ථ **තුනක්** සඳහන් කරන්න.

(1) ....

(2) ....

(3) ....

(ii) වඩාත් සුදුසු වචනය යොදමින් හිස්තැන් පුරවන්න.

(1) බිම් සැකසීම සමග පසක ජල සන්නායකතාව .... (වැඩිවේ. / අඩුවේ / වෙනස් නොවේ.)

(2) බිම් සැකසීම සමග පස මතුපිට අහඹු රළු බව (random roughness) .... (වැඩිවේ. / අඩුවේ. / වෙනස් නොවේ.)

(3) සංතෘප්ත අවස්ථාවේ දී තෙතමන ප්‍රතිශතය, නොසැකසූ පසකට සාපේක්ෂ ව හොඳින් සැකසූ පසක .... (වැඩිය. / අඩුය. / නොවෙනස්ය.)

(4) බිම් සැකසීම සමග පසක දෘශ්‍ය ඝනත්වය .... (වැඩිවේ. / අඩු වේ. / වෙනස් නොවේ.)

(iii) මූලික බිම් සැකසීමේ ප්‍රධාන පියවර **තුනක්** ලැයිස්තු ගත කරන්න.

(1) ....

(2) ....

(3) ....

(B) පාංශු ඛාදනය වීමේ විශාල අවදානමක් සහිත බෑවුම් භූමියක් හිමි ගොවියෙකු එම භූමියෙහි විශාල බීජ සහිත වාර්ෂික බෝගයක් වගා කිරීමට අපේක්ෂා කරයි.

(i) මෙම භූමියට උචිත බිම් සැකසීමේ ක්‍රමයක් නම් කරන්න.

....

(ii) මෙම භූමියෙහි **පස් අංශු දේහයෙන් වෙන්වීම** (Soil detachment) පාලනය කිරීම සඳහා යෝග්‍ය පාංශු ඛාදනය පාලනය කිරීමේ ක්‍රමයක් සඳහන් කරන්න.

....

(iii) ඉහත භූමියෙහි වගා කළ බෝගයක් සඳහා බෝග ජල අවශ්‍යතාවය (crop water requirement) මිලිමීටර 200ක් වේ. බෝග වගා කන්නය තුළ සඵල වර්ෂාපතනය මිලිමීටර 120 කි. භූගත ජලයෙන් ලැබෙන දායකත්වය මිලිමීටර 20 කි. මෙම ක්ෂේත්‍රය සඳහා වාරි ජල අවශ්‍යතාවය (irrigation water requirement) කොපමණ ද?

....

(iv) මෙම භූමිය සඳහා සුදුසු වාරි ජල සම්පාදන ක්‍රමයක් නම් කරන්න.

....

Scanned with CamScanner

(v) ඉහත නම් කළ වාරි ජල සම්පාදන ක්‍රමයේ වාසි හා අවාසි සඳහන් කරන්න.

වාසි.

(1) ....

(2) ....

අවාසි

(1) ....

(2) ....

(vi) මෙම ගොවියා මහ කන්නයේ දී බෝගයක් වගා කිරීමට අපේක්ෂා කරන්නේ නම්, බෝගය සිටුවිය යුත්තේ කුමන මාසයේ දී ද ?

....

(vii) මෙම භූමියේ සුළං බාදනය හා බෝග වලට සුළඟ මගින් වන හානිය සැලකිය යුතු තරම් වේ නම්, මෙම ගැටළුව පාලනය කිරීම සඳහා සුදුසු ක්‍රමයක් දක්වන්න.

....

(C) (i) සංරක්ෂණ ගොවිතැනේ දී (conservation farming) සංරක්ෂණය කරනු ලබන ස්වාභාවික සම්පත් **දෙකක්** නම් කරන්න.

(1) ....

(2) ....

(ii) සංරක්ෂණ ගොවිතැනේ දී ස්වාභාවික සම්පත් සංරක්ෂණය සඳහා යොදා ගන්නා ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.

(1) ....

(2) ....

(iii) සංරක්ෂණ ගොවිතැන භාවිත කළ යුතු කෘෂි පාරිසරික කලාපයක් නම් කරන්න.

....

02. (A) ගොවියෙකුට වද ශාක (Hibiscus plants) අතු කැබලි මගින් ප්‍රචාරණය කිරීමට අවශ්‍ය විය. මේ සඳහා ඔහු මෑතක දී කප්පාදු කරන ලද, හොඳින් පොහොර යෙදූ වද ශාකයක අලුත වැඩුන ප්‍රරෝහයන්ගෙන් අර්ධ කාෂ්ඨීය (Semi-hard wood) අතු කැබලි ලබාගන්නා ලදී. මෙම අතු කැබලි කොම්පෝස්ට් හා කොහුබත් මිශ්‍රණයක් සහිත පොලිතීන් කවරවල සිටුවන ලදී. සිටු වීමට පෙර ඔහු අතු කැබලිවල පත්‍රවලින් අඩක් ඉවත් කරන ලදී. ඉන්පසුව මෙම පොලිතීන් කවර පොලිතීන් ගෘහයක් (Poly-tunnel) තුළ තබන ලදී.

(i) මෑතක දී කප්පාදු කළ, හොඳින් පොහොර යෙදූ ශාකයක, අලුත වැඩුන ප්‍රරෝහයන්ගෙන් ලබා ගත් අර්ධ කාෂ්ඨීය අතු කැබලි භාවිත කිරීමට හේතුව කුමක්ද ?

....

(ii) ගොවියා සිය බඳුන් මාධ්‍යය (Potting medium) ලෙස කොම්පෝස්ට් හා කොහුබත් මිශ්‍රණයක් භාවිත කළේ මන් ද ?

....

(iii) සිටුවන අවස්ථාවේ දී ගොවියා අතු කැබලිවල පත්‍රවලින් අඩක් ඉවත් කළේ මන් ද?

....

(iv) ගොවියා අතු කැබලිවල සියළු ම පත්‍ර ඉවත් **නොකළේ** මන් ද ?

....

(v) ගොවියා බඳුන්ගත කළ අතු කැබලි පොලිතීන් ගෘහයක් තුළ තැබුවේ මන්ද ?

....

(vi) පොලිතීන් ගෘහයක් තුළ තැබූ අතු කැබලිවල වර්ධනයට බලපාන ප්‍රධාන පාරිසරික සාධක මොනවා ද ?

(1) ....

(2) ....

(vii) අතු කැබලි මගින් ප්‍රචාරණයට අමතරව, වද ශාකය සඳහා උචිත වර්ධක ප්‍රචාරණ ක්‍රම **දෙකක්** නම් කරන්න.

(1) ....

(2) ....

Scanned with CamScanner

(viii) එකම මාතෘ ශාකයකින් වර්ධක ප්‍රචාරණය මගින් බිහි කර ගන්නා ලද ශාක කාණ්ඩයක් හැඳින්වීම සඳහා තනි වචනයක් දක්වන්න.

....

(ix) වර්ධකව ප්‍රචාරණය කළ ශාක ගහණයක් තුළ ප්‍රවේණික විචල්‍යතාවයක් ඇති කළ හැකි ක්‍රමයක් නම් කරන්න.

....

(B) ගොවියෙක් කොම්පෝස්ට් සෑදීම සඳහා පිදුරු, වල් පැළෑටි, ලී කුඩු හා තණකොළ එකතු කර ගෙන ඇත.

(i) සුදුසු C/N අනුපාතයක් පවත්වා ගැනීම සඳහා කොම්පෝස්ට් ගොඩට එකතු කළ යුතු තවත් සංඝටක **දෙකක්** නම් කරන්න.

(1) ....

(2) ....

(ii) කොම්පෝස්ට් ගොඩට ලී අළු එකතු කිරීමේ අරමුණ කුමක් ද?

....

(iii) කාබනික පොහොර භාවිතයේ ප්‍රධාන අවාසි **තුනක්** නම් කරන්න.

(1) ....

(2) ....

(3) ....

(iv) පොහොර භාවිත කාර්යක්ෂමතාව වැඩි කළ හැකි ක්‍රම **තුනක්** සඳහන් කරන්න.

(1) ....

(2) ....

(3) ....

(C) අංක (i) හා (ii) ප්‍රශ්නවලට පිළිතුරු දීම සඳහා පහත දැක්වෙන රූප සටහන යොදා ගන්න.



(i) ඉහත රූප සටහනේ A සිට D දක්වා කොටස් නම් කර එක් එක් කොටසෙහි ප්‍රධාන කාර්යය සඳහන් කරන්න.

	කොටසේ නම	කාර්යය
A	....	....
B	....	....
C	....	....
D	....	....

(ii) ජල ඌනතාවයක දී E හි හැසිරීම කෙබඳු වේ ද ?

....

03. (A) එළදෙනකගේ බුරුල්ලෙහි රූප සටහනක් පහත දැක්වේ.



Scanned with CamScanner

(i) ඉහත රූප සටහනෙහි A සිට C දක්වා කොටස් නම් කර එක් එක් කොටසෙහි ප්‍රධාන කාර්යය සඳහන් කරන්න.

	කොටසේ නම	කාර්යය
A	....	....
B	....	....
C	....	....

(ii) පහත දැක්වෙන හෝර්මෝනවල සම්භවය වන ස්ථානය හා කාර්යය සඳහන් කරන්න.

	සම්භවය වන ස්ථානය	කාර්යය
ඊස්ට්‍රජන්	....	....
ඔක්සිටෝසින්	....	....
ටෙස්ටෙස්ටරෝන්	....	....

(iii) ගොවිපළ සතුන් දෙමුහුම් අභිජනනය කිරීමේ වාසි **දෙකක්** ලැයිස්තු ගත කරන්න.

(1) ....

(2) ....

(iv) ගොවිපළ සතුන්ගේ "සුව පහසු කලාපය" (Comfort Zone) තීරණය කිරීමේ දී සලකනු ලබන ප්‍රධාන කාලගුණික සාධක **දෙකක්** නම් කරන්න.

(1) ....

(2) ....

(B) කුකුළන් සඳහා භාවිත වන ප්‍රධාන ප්‍රෝටීන් ආහාර සංඝටක **තුනක්** හා ඒවායේ අඩංගු ප්‍රෝටීන් ප්‍රමාණ ලැයිස්තු ගත කරන්න.

	ආහාර සංඝටකය	ප්‍රෝටීන් ප්‍රමාණය (%)
(1)	....	....
(2)	....	....
(3)	....	....

(C) වී කෙටීමේ (rice milling) කාර්යාවලියට අදාළ ප්‍රධාන ක්‍රියාකාරකම් **තුනක්** ලැයිස්තු ගත කරන්න.

(1) ....

(2) ....

(3) ....

04. (A) (i) කෘෂි පළිබෝධයන්ට එරෙහිව භාවිත කරනු ලබන ජෛව පාලන කාරකයන් (biological control agents) **තුනක්** නම් කරන්න.

(1) ....

(2) ....

(3) ....

(ii) කෘෂි පළිබෝධ පාලනය සඳහා රසායනික පාලනයට වඩා ජෛව පාලනය භාවිත කිරීමෙන් ලැබිය හැකි වාසි **තුනක්** නම් කරන්න.

(1) ....

(2) ....

(3) ....

(iii) කෘමිනාශක ආකාර (formulations) වර්ග **හතරක්** නම් කරන්න.

(1) ....

(2) ....

(3) ....

(4) ....

(B) (i) බෝග ශාකවල රෝග ඇති කරන ව්‍යාධිජනකයින් **තුනක්** ලැයිස්තු ගත කරන්න.

(1) ....

(2) ....

(3) ....

Scanned with CamScanner

(ii) ශාකයන් හි රෝග වර්ධනය වීමට හිතකර වැදගත් තත්ත්ව දෙකක් සඳහන් කරන්න.
(1) ....
(2) ....
(3) ....

(C) පහත දී ඇති රූප සටහනේ ගම්මිරිස් සඳහා ඉල්ලුම් (D), සැපයුම් (S) වක්‍ර සහ විවිධ මිල (P) සහ ඉල්ලුම් සහ සහ සැපයුම් ප්‍රමාණ (Q) දක්වා ඇත.



(i) නිදහස් වෙළෙඳපළක (රාජ්‍ය මැදිහත්වීම් වලින් තොර) මිල, ඉල්ලුම් සහ සැපයුම් ප්‍රමාණ කොපමණ ද?
(1) මිල ....
(2) ඉල්ලුම ....
(3) සැපයුම ....

(ii) රාජ්‍ය මැදිහත් වීමෙන් ගම්මිරිස් සඳහා කිලෝග්‍රෑමයට රු. P_1 සහතික මිලක් දුන්නේ නම් වෙළෙඳපළ මිල සහ ඉල්ලුම සහ සැපයුම් ප්‍රමාණ කොපමණ ද?
(1) මිල ....
(2) ඉල්ලුම ....
(3) සැපයුම ....

(iii) කිලෝග්‍රෑමයකට රු. P_1 නම් සහතික මිලකට රජය විසින් මිලදී ගත යුතු ගම්මිරිස් ප්‍රමාණය කොපමණ ද?
....

(iv) කිලෝග්‍රෑමයකට රු. P_3 සහතික මිලක් රජය තීරණය කළේ නම් වෙළෙඳපළ මිල, ඉල්ලුම් සහ සැපයුම් ප්‍රමාණ කොපමණ ද?
(1) මිල ....
(2) ඉල්ලුම ....
(3) සැපයුම ....

❀❀❀ ❀❀ ❀❀❀

Scanned with CamScanner

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2001 අගෝස්තු

General Certificate of Education (Adv. Level) Examination, August 2001

කෘෂි විද්‍යාව II

Agricultural Science II

"ආ" කොටස - රචනා

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.
අවශ්‍ය තැන්හි දී නම් කරන ලද පැහැදිලි රූප සටහන් දෙන්න.
(සෑම ප්‍රශ්නයකට ම ලකුණු 15 බැගින් ලැබේ.)

05 (i) ජල චක්‍රය (hydrological cycle) යනු කුමක් ද ? ජල චක්‍රයේ ඇතිවන අසමතුලිතතා කෘෂිකර්මයට බලපාන්නේ කෙසේ ද ?

(ii) පාංශු පැතිකඩක් යනු කුමක් ද? පාංශු පැතිකඩක් වර්ධනය වීමට බලපාන සාධක මොනවා ද ?

(iii) පාෂාණ ජීර්ණය යනු කුමක් ද ? පාෂාණ, රසායනික ජීර්ණය වන ආකාර විස්තර කරන්න.

06 (i) බිම් සැකසීම යනු කුමක් ද ? පසෙහි භෞතික ගුණාංග කෙරෙහි බිම් සැකසීම බලපාන්නේ කෙසේ ද ?

(ii) පාංශු බාදනය යනු කුමක් ද ? පාංශු බාදනය වන ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා ක්‍රමයක් විස්තර කරන්න.

(iii) විවිධ පෘෂ්ඨීය වාරි ජලසම්පාදන ක්‍රම පැහැදිලි කරන්න.

07 (i) බීජ ජීව්‍යතාවය යනු කුමක් ද ? බීජ ජීව්‍යතාවයට බලපාන අභ්‍යන්තර හා බාහිර සාධක මොනවා ද ?

(ii) වර්ධක ප්‍රචාරනය යනු කුමක් ද ? වර්ධක ප්‍රචාරනයේ ප්‍රධාන වාසි මොනවා ද ?

(iii) කාබනික පොහොර යනු කුමක් ද ? කාබනික පොහොර භාවිතයේ වාසි මොනවා ද ?

08 (i) පාලිත තත්ත්ව යටතේ බෝග වගාකිරීමේ වාසි මොනවා ද ?

(ii) විවිධ ශාක හෝර්මෝන කාණ්ඩ මොනවා ද ? ඔක්සින මගින් යාමනය කරන පරිවෘත්තීය ක්‍රියාවන් මොනවා ද ?

(iii) ආහාර අධිශීතකරණය (freezing) කිරීමේ දී හා අධිශීත ගබඩා (frozen storage) කර තැබීමේ දී සිදුවන ජෛව, භෞතික හා රසායනික වෙනස්කම් විස්තර කරන්න.

09 (i) නම් කරන ලද පැහැදිලි රූප සටහනක ආධාරයෙන් පිරිමි ඌරාගේ ප්‍රජනක පද්ධතියේ විවිධ කොටස්වල ක්‍රියාකාරිත්වය විස්තර කරන්න.

(ii) ශ්‍රී ලංකාව තුළ මුඛ හා කුර රෝගය පැතිරීම වැළැක්වීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග විස්තර කරන්න.

(iii) හොඳ ගුණාත්මයෙන් යුතු යෝගට් නිෂ්පාදන ක්‍රියාවලියක ඇතුළත් විය යුතු පියවරවල් විස්තර කරන්න.

10 (i) නිරුඟු පිටි මිල ඉහළ යාමක දී සමතුලිත සහල් මිලෙහි වෙනස් වීම රූප සටහනක් ආධාරයෙන් පැහැදිලි කරන්න.

(ii) කෘෂි පාරිසරික පද්ධතියක් තුළ කෘමි පළිබෝධ වසංගතයක් ඇති වීමට දායක වන සාධක විස්තර කරන්න.

(iii) ආගන්තුක ආක්‍රමණකාරී වල් පැළෑටි විශේෂ (alien invasive weed species) පාලනය කිරීම සඳහා යොදා ගත යුතු ක්‍රම විස්තර කරන්න.

Scanned with CamScanner